# නිර්මාණ Nirmana







උඩරට නර්තන

## කඳුරට අබිමානය

සඳ කිරණින් දෝවන වී සිත සතොසේ
පිපි වනමල් දම් සරසා කඳු සිරසේ
නෙක තරුවැල් පිරිවර සැදුමෙන් සහසේ
වන වැසි දෙව් පිරිස් දා පෙරහර දෙපසේ

සුදුවත් සැරසි බොදුනුන් හා සමගි වෙමින්
සැදුමෙන් දෙපස පෙරහැර බැති සිතිනි පහන්
දුටු මෙන් තථාගත දිවමන් බඳුරු සමන්
සරසයි සමිඳු දළදා කුසුමෙන් දැ සමන්

තුන්ලෝ තිලක සැකි සිහ දළදා සමිඳු
ගුම් දෙන දම්සරින් ඔප වී වන පුබුදු
දෙව් බඹු නරන් නංවන පෙරහර සුසැදු
සෙංකඩගලින් පිබිදෙයි සව්සත කුමුදු

♦ **පූජ්‍ය ඇත්තලපිටියේ චන්ද්‍රවිමල නාහිමි**
Sri Lanka

## දළදා උපහාර

සිය පරපුරේ දායාදය
පරිදි එන
උපහාරයක් ලෙස
දළදා හිමිට දෙන
අල්ලා කස්තිරම්
නටමින් ඉහළ පැන
පෙන්වති නැට්ටුවෝ
දස්කම් පහළ වුණ

සහවා උඩහුකම
පා තබමින් බරට
බුදු හිමි සැදූ මග
සිහිකර මොක්පුරට
කරඬුව රැගෙන දෙපසින්
තරකොට මුරට
පාවඩ උඩින් යයි
මංගල ඇතු පෙරට

♦ **රන්ජිත් නිමලසිරි ජයසේන**
**මිනුවන්ගොඩ**
Sri Lanka

## දළදා හාමුදුරුවනේ !

වෙළ පෙළ උඩුවියන සිව් කොණ බැඳි නුබය
සුවඳැති මලින් නිති පුද දෙන වන ගබය
හිමිසඳ මතු ද, මැඳුර ද දසුනට සුබය
දැය මහ පහග රන්කොත සමිඳුනි ඔබය!

කගපත හිතෙහි රඳවාගෙන මුවග බැමී
යුද වැදි රදුන් මිණි කිරුළිස හිමිට හිමී
සිත තුළ කියුම් පවසමි අබියසෙහි නැමී
දළදා සිරිත හෙළ දැ සිරිතකි ය හිමී

බ ල මුළු විරුදු දෙන විට හෙළ දැයට විනේ
ව ල වැද සමිඳු සඳ සහවා සිවුරු කොණේ
ද ළ දුක් නොවිඳි නම් සහ ගණ ඇතිව සෙනේ
හෙළ යක් නොමැත දළදා හාමුදුරු වනේ

ද ම් කඳ පහස ලත් බව දුක නිවන ලද
පින් වත් හිමිට උරුමය බුදු හිමිගෙ තෙද
තුන් හෙළයටම දිවමන් බුදු රදෙකි අද
රන් සිළුමිණකි මම නමදිමි දොහොත බැඳ

නුබ කත පුදයි වගුරා රිවි සඳ කිරණ
වනපස මලින් පියවිලි සරසයි දෙරණ
තිලොවග හිමිසඳුගෙ පෙරුමන් බල දරණ
මගෙ මුළු රටට හිමි ම ය සදහට සරණ!

*රත්තොට හිටපු මන්ත්‍රී, අභාවප්‍රාප්ත,*
♦ **පී. බී. කවිරත්න**

## උඩරට නර්තන

සසල කරන දන හදවත් නැටුමින් රූ සිරිනා
පතල යසස් කිත් ඇති දළදා සමිඳුන් සොබනා
එකල භරත මුණි වදහළ අභිනය පා නටනා
සකල දැයම සලිත කරයි ඔබෙ කිංකිණි හඬිනා

කන් කළු බෙර පදය වැයෙත තාලෙට පා තබනා
සිං හල රට දැය සමයම සතුටු සිතින් පිනනා
මන් මත් කළ සුවහස් දන කඳුකර පුර ගමනා
සෙං කඩ ගල නුවර අසිරි දළදා හිමි සරණා

මා ල ගෙලෙහි සේද ගතෙහි තෝඩු කනෙහි දිලෙනා
නී ල වරල පාන ළඳුන් වන්නම් පද ගයනා
ආ ල වඩන නාද ගිගුම් පසතුරු ගොස ඇසෙනා
කෝල නැටුම් පෙරහැර මැද ගිජිඳුන් පා තබනා

දැ ස ලැබූ පින වටහා දෙන අපහට නිතිනා
දේ ස දේස ලෝ ජනතා ගරු බුහුමන් ලබනා
දෝස නොවී වොරැඳී වස් දස දහසක් යෙහෙනා
වා ස නාව ඔබ රැඟුමයි සිරිලක බබලවනා

♦ **ගමගේ පලිහපිටිය**
Ottawa - Canada

## ESALA PERAHERA

With lumbering, padded steps,
Richly embellished in gem-emblazoned satin,
Long line of tuskers join Lord Buddha's devotees.
From the **Dalada Maligawa**, nobles, and safron-robed bhikkus
Follow in reverent line.
Acrobats swiftly rotates their wheels of fire, (wheels of life),
Drummers beat intricate tattoos for ankle-belled dancers
costumed in silver,
On enthralled faces multi-coloured torches shed incandescent glows,
Whips crack the air, a hundred whistles shrill ----
A festival for beggar and king alike.

❊ ❊ ❊ ❊ ❊ ❊ ❊ ❊ ❊ ❊ ❊ ❊ ❊ ❊

I fix my joyful thoughts on a crystal of priceless worth,
**Lord Gauthama's**.

♦ **Denis Jansz** - *London NW 8*

## බැතිබර වන්දනාව

සංගීතවත් කර මුළු රට පුරා සරය
නද දෙයි තාලයට හේවිසි ගැට බෙරය
අබිමානවත් ගමනක ඇති පිරී වරය
ගරු බහුමානයෙන් යන මහ පෙර හැරය

මැද මහනුවර සිරි දළදා සමිඳු වැඳ
මුණිගුණ රැඳුණු සිරි මහබෝ සුවය විඳ
බොදු උවැසියන් හා උවසුන් අතර හිඳ
බැතිබර වන්දනාවක යයි ඇසළ සඳ

♦ **ජගත් වෙත්තසිංහ**
Melbourne - Australia

## පෙරහැරේ රාජා

තුන්සිය හැට පහක් දින ගනිමින් ගෙවන
රාජකාරි යුතුකම් පිළිවෙත් පුරන
බුදුන් දහම් දැන නිති සහගණ වඩින
උතුමෙකි රජිඳ ඔබ! කැල පණ මෙන් රකින

හොරණෑ දවුල් හඬ විසිරෙන දෙසට නුබ
ගජගා තාල වන්නම් නළු හුරුව ලැබ
හිස මත දරා කරඬුව කළ රනින් දඹ
නිලමෙගෙ ගමන පරදයි ඇත් රජිඳ ඔබ !

මිනිසුන් සහ ඇතුන් හිස් ලූ අත දුවන
අලි කළඹලය සිහිවෙයි ඇඟ කිළි පොලන
නොදිටිමු එකෙක් නොබියව එක තැන සිටින
රාජා බිඳක් නොසැලුනි දැහැනට වැදුණ

නායකයෙකි, රජෙකි කොඳු ඇට පෙළ තිබෙන
රටකට රජෙකි රාජා පිළිවෙත් දරන
වෙන රාජලාටත් ආදර්සෙට වටින
ඔබ බෝසතෙකි! මතු බුදු පදවිය පතන

♦ **කරුණා බස්නායක**
Hampstead, London

## මව් සැමරුම් !

පිංපෙත් පුරා මියගිය දින සම රන්න
ඔබ කළ සේවයට කළගුණ සල කන්න
දන් කත් උයා පන්සල වෙත ගෙන යන්න
අද බැරිවිය අම්මෙ මා මෙහි ලෙඩ බැවින

අම්මා කියන වචනයෙ ඇති මහ බලය
වටහාගත්තෙ ඔබගෙන් බව පැහැ දිලිය
දන්බත් උයා පුද නොකළත් මේ දිනය
නැහැ අමතක වුණේ ඔබ වියොවූ දිනය

වසරක් පතා ඔබ ගිය දින සිහි කරලා
පින්පෙත් පුරා ඔබහට බුහුමන් කරලා
සැනසුණ මෙමා අද රෝහල් ඇඳට වෙලා
සිහිකර ඔබේ ගුණ සැනසෙමි හද සසලා

♦ **මධුරි අබේවික්‍රම**
Harrow UK

## පෙර වීර මව්වරුන්

දැවෙන තෙල්වල ගිලුණු
රහත් සහ නම නිසා
මුහුද ගොඩ ගැලූදා අතීතේ
වෙහෙර මහ දේවි මෙන්
දිරියෙන්ම දිවි දෙමී

දිවෙන අස්රිය නැගුණු
ගම් අබා රජු නිසා
රියෙන් බට රුපුන් පත්
සෝමවත් දේවි මෙන්
දිරියෙන්ම දිවි දෙමී

හඬන වන ලා කෙටුණු
වැරදි නැති දරු පුදා
පරපුරක් නැසුවාද අතීතේ
ඇහැලෙපොල දේවි මෙන්
දිරියෙන්ම දිවි දෙමී

රජුන් රැකුණොත් නිබඳ
පමණි රට රැකෙන්නේ
පෙර වීර මව්වරුන්
අපට මග සදන්නේ

♦ **Dr වික්‍රම්ප්‍රිය පෙරේරා** USA

## හිමි ගුණවරුණ

පර උවදුරු වළදි දිවි පරදුවට තබා
නරපතියන් විසින් රැක සතුරනට නොබා
සරසන තිලොව හිමි ගුණ රුව වරුණ අඹා
පුර මහනුවර බල! දළදා වඩින සුබා

තැන තැන මෙපුර පුද පෙරහැර ඇසළ මහේ
නැණ මන පිනන හිමි ගුණ දියතටම ඇහේ
මොන මොන වැරදි තිබුණත් මිනිසුනගෙ ඉහේ
බණ පදයකට සියළුම දුක් ගැහැට නැහේ

♦ **තල්ගම්පල ගුණසේන** - Sri Lanka

## දළදා වන්දනා !

හේමමාලි කුමරිය මෙහි ගෙනෙන ලද
සහපිරිවරින් හැමදින පුද ලබන ලද
ලොව හැමදෙනා මව්තෙට පත්කරන ලද
දළදා සමිඳු වඳිනෙමි බැති සිතින් අද

හිඳ මංගල ඇතෙකු පිට ගරුසරු ඇතුව
හිමි වඩිනා කලට නිළමේ සහ කැටුව
දහසක් පැතුම් සපුරා දෙයි නිර තුරුව
මේ මොන අසිරියක්දෝ සැමදෙන සිතුව

උඩරට නැට්ටුවන් තාලෙට නටන් නේ
නලා හඬින් කන් අඩි පුපුරා යන් නේ
අලි ඇත්තුනුත් බුදුගුණ ගයමින් යන් නේ
පෙරහැර නුදුටු ඇස් කුමටද තිබෙන් නේ

කිත්සිරිමෙවන් නිරිඳුන් දෙව්ලොවේ සිට
ගරුසරු ඇතිව දළදා හිමි වඩින විට
පෙරහැර බලන්නට ඇවිදින් විටින් විට
සෙත් පැන් ඉසී දෙව්ලොව සිට හතර වට

රට රටවලින් ජන ගංගා ඇදෙන විට
හැම දෙන නෙත් අයාගෙන ගරු කරන විට
ලක්දිව ඉපදීම පිනෙකැයි සිතෙන විට
දළදා සමිඳු පිහිටයි මට සහ ඔබට

♦ **එස්. කංකානම්ගේ**
London SE 5

## ප්‍රේමය නම් කිමැයි



කව්කාර මල් පිපුණු
නිල්පාට කඳු මුදුන මතින්
තෙලිකුර නිදහසේ මුදාහළ
සොඳුරු සිත්තම නුඹයි.....

බැත සුවඳ පිරි
මැටි කුඹුරක හීන් නියරේ
තණ උලාකන
පුංචි වසු පැටියන්ගෙ
ගෙල හැඩෙන මිණිගෙඩියෙ
මිහිරි හඬ නුඹයි.....

මංපෙතක සුරතලෙන් පය සිඹින
පියකරුම කහපාට පුංචි
ගොඩ මානෙල් මල නුඹයි.....

♦ **වසන්තා කුමාරි දසනායක**
කිරිඳිවැල - Sri Lanka

## දළදා පෙරහැර

සම්බුදු සමිඳු දෙසූ බුදුබණ ලොවට එදා
පින් සිදුකරන සිතුවිලි මතු කරති සදා
එම බුදු මුවින් ලද දළදා සමිඳු පුදා
තුන් සිත පහදමින් පෙරහැර කරති මෙදා

සිරි දළදා සමිඳු හෙළබිම තැබී මට
දිවිහිමියෙන්ම ගත් තැත ගැන අගේ කොට
වසරට වරක් කළ පෙරහැර එදා සිට
අද ඉටු කරති බොදු මනසෙහි රැඳී මට

♦ **සිරිල් පී. ගුණරත්න**
පිලියන්දල Sri Lanka